# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2167/1 - 2020 මාර්තු මස 16 වැනි සඳුදා - 2020.03.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016(II)

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි (පා.ම),
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය.

2020 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2020 ජනවාරි මස 29 වන දිනැති අංක 2160/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2020 අංක 1 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ ඃ

(1) 8 වන නියෝගයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන්

"8අ. කිසිදු තැනැත්තකු විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව මෙහි උපලේඛනයේ I වන තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති කිසිදු වෛද්‍ය උපකරණයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ප්‍රතිඅපනයනය කිරීම සිදු නොකළ යුතු ය."

(2) එහි උපලේඛනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් ඃ


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

(2 වන නියෝගය)

තෝරාගත් වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල

| *අංකය* | *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|---|
| | *වෛද්‍ය උපකරණවල අනුමත නාමය* | *එක් ඒකකයක උපරිම සිල්ලර මිල (MRP) (ශ්‍රී ලාංකීය රුපියල්) (SLR)* |
| 1 | ඉවත දැමිය හැකි ශල්‍ය මුහුණු ආවරණ - ස්ථර තුනක් සහිත - නොවියන ලද (ලූපය සහිත හෝ ගැට ගසන) | 50.00 |
| 2 | මුහුණු ආවරණ - එන් 95 වර්ගය - (ශල්‍ය/සෞඛ්‍ය රක්ෂිත/ශ්වසන/වෛද්‍ය) | 325.00 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.